පොතුවිල් ප්‍රාදේශීය සභාව - 2024

----

1 මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොතුවිල් ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන 1.6.1 (ආ) හැර ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ඉන්ධන වියදම් රු.177,311 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර නිවැරදි කරනු ලබන බවත්, ඉදිරියේදී මෙවැනි දෝෂ සිදුනොවන පරිදි සැලකිලිමත් වන බව.	ගැලපීම් සිදුකර නිවැරදිව වියදම් අනාවරණය කළ යුතුය.
(ආ)	2022 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ එකතුව රු.212,734 ක් වූ පොත් වටිනා පොත් 601 ක් සහ පොත් රාක්ක හා පරිගනක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	-එම-	සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය.
(ඇ)	සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 264ක් 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර ඒ අනුව එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	-එම-	ඉඩම් ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.
(ඈ)	සභාවට අයත් වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	-එම-	වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය	සභා බලප්‍රදේශයේ පිහිටි වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශ කාලීනව	සභා බලප්‍රදේශයේ පවතින දේපළ මත වරිපනම් බදු අයකිරීම	අයකළ යුතු වරිපනම් බදු මූලාශ්‍ර හඳුනාගෙන

	හඳුනාගෙන ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	සඳහා සභාවේ සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන ඇත. එවැනි සංවර්ධිත ප්‍රදේශවලට වරිපනම් බදු ඉදිරි කාලයේ පනවා අයකිරීම් සිදුකිරිමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගතයුතුය.
(ආ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලන රීති මාලාව			
(i) 5(xii) රීතිය	මුදල් හා චෙක්පත්වල අත්සන් කරනු ලබන නිලධාරීන්, ආදායම් රැස්කිරිමේ නිලධාරී සහ ගබඩා ද්‍රව්‍ය ආදිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප මුදලක් ලබාගැනිමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී ඇප මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව.	ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii) 218 රීතිය	සභාවේ සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකම එක් වරක් හෝ පරීක්ෂා කිරිමට පියවර ගෙන නොතිබුණි.	පොතුවිල් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දේපළ බදු අයකිරීමේ මූලික කාර්යයන් සිදුවෙමින් පවතී. ඒ අනුව දේපළ බදු අයකිරිම සඳහා දේපළ වටිනාකම් තක්සේරු කිරීම් සිදුකරනු ලබන බව.	රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 31,686,069 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,495,411 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	850,000	850,000	30,686	819,314	3,500,000	3,500,000	130,000	3,370,000
(ii)	කුලී	15,220,000	38,563,070	12,413,900	26,149,170	19,750,000	34,284,358	10,941,288	23,343,070
(iii)	බලපත්‍ර ගාස්තු	4,910,000	4,910,000	2,318,750	2,591,250	5,010,000	5,010,000	4,062,720	947,280
(iv)	වෙනත් ආදායම්	31,020,000	31,020,000	37,483,408	(6,463,408)	9,205,000	9,205,000	4,793,278	4,411,721
	එකතුව	52,000,000	75,343,070	52,246,744	23,096,326	37,465,000	51,999,358	19,927,286	32,072,071

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වෙළඳපොළ කඩකාමර කුලී රු.6,578,220 කින් කුලීහිමියන් 11ක ගෙන් වර්ෂ 10 සිට 20 ක් දක්වා වූ රු.171,520 ක්ද, වර්ෂ 02ක් දක්වා හිඟහිටි මුදල රු.2,479,000ක් ද, සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි රු.2,392,000 ක් ද පැවැතුණි.	හිඟහිටි අයකර ගැනිමට ක්‍රියාමාර්ග ගෙන අයකිරීම් සිදු කරමින් පවතින බව.	අයකළ යුතු හිඟමුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකළ යුතු වෙළෙඳපොල කඩකාමර කුලී රු.9,491,838කින් වර්ෂ 25කට වඩා අධික හිඟහිටි රු.4,637,377ක්ද, වර්ෂ 02කට අධික හිඟහිටි රු.4,643,710ක් ද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	කුලී සම්බන්ධයෙන් සංශෝධිත වටිනාකම් ගණනය කර ඒ අනුව වර්ෂයේ ඇස්තමේන්තුවල ඇතුළත් කිරීමට පියවර ගැනීමට නියමිත බව.	අයකළ යුතු හිඟහිටි කඩකාමර කුලී කඩිනමින් අයකර ගැනීමට පියවර ගතයුතුය.
(ඇ)	සභාවට අයත් කඩකාමර සඳහා අයකරනු ලබන කඩකුලී වටිනාකම වර්තමාන වෙළෙඳපොල වටිනාකමට අනුකූලව කාලානුරූපීව තක්සේරු කර කුලිය අයකිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී කුලියට ලබාගත් අය සමග අළුතින් ගිවිසුම්වලට එළැඹීමටත්, කුලී වටිනාකමෙහි සංශෝධනයන් සිදුකිරීමටත් තීරණය කර ඇති බව.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක කළයුතුය.

(ඈ)	සභාව විසින් වෙළෙඳ බලපත්‍ර ගාස්තු මගින් උපරිම ආදායම් ලබාගත හැකි පරිදි ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර නිවැරදි තොරතුරු රැස්කර ලේඛන සම්පූර්ණ කර පවත්වාගෙන යාමටත් ආදායම් ගණනය කිරීමටත්, පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාවේ වාර්ෂික ආදායම් ඉපැයිය හැකි ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂවල පිළිවෙලින් 1,020, 802, 830, 864, 741 සහ 443 වශයෙන් උච්චාවචනය වෙමින් පැවතුණි.	ව්‍යාපාරික ආයතන සඳහා එහි සෞඛ්‍ය හා පිළිගත හැකි කරුණු පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම් සිදුකරන බව.	නියමිත විධිවිධාන අනුව වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගතයුතුය.
(ඉ)	ව්‍යාපාරික ආයතන 238කට වෙළද බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට සැලකිලිමත් වන බව.	අදාල කඩකාමර පරීක්ෂා කර බලපත්‍ර නිකුත් කළයුතුය.
(ඊ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව, සෑම වර්ෂයක් අවසානයේදීම ඉඩම් ගනුදෙනු මත මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම් ඉල්ලුම් කිරීමේ අයදුම් පත් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාට යැවිය යුතු වූවත්, සභාව විසින් ඉඩම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරගෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු නියමිත කාල වකවානු තුළ ඉල්ලීම් කර ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී මේවා පරීක්ෂා කර නොපමාව ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 ආර්ථික නොවූ ගනුදෙනු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැය 88කට රු. 836,500 ක් ගෙවා තිබූ නමුත්, මෙම ගෙවීම් සඳහා භාවිතා කළ **JCB** යන්ත්‍රයේ පැය	ඉදිරි කාලයේදී මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමර්ග ගනු ලබන බව.	**JCB** යන්ත්‍රයක සේවා ලබා ගැනීමේදී යන්ත්‍ර පැය ගණන තහවුරු කරගෙන

	ගණන තහවුරු කළ නොහැකි වී තිබුණි. එසේම, සභාවට අයත් **JCB** යන්ත්‍රයක් තිබූ නමුත් එම යන්ත්‍රය 2021 දෙසැම්බර් 08 දින සිට හානියට පත්වී තිබූ අතර සභාව විසින් එය අළුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග නොගැනීමෙන් සභාවට උපයාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.		ගෙවීම් කළ යුතු අතර සභාවේ යන්ත්‍රය කඩිනමින් අලුත්වැඩියා කර සේවයේ යෙදවීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ජලසම්පාදන හා මලාපවහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතාව ලබාගැනීම සඳහා පලුදු කරන ලද මාර්ග 34ක් ප්‍රතිසංස්කරණය නොකිරිමෙන් එම මාර්ග විශාල වශයෙන් හානියට පත්වී තිබූ අතර ඉදිරියේදී සම්පූර්ණයෙන් නැවත ප්‍රතිසංස්කරණය කිරිමේ අවශ්‍යතාවයක් මතු විය හැකි බව නිරීක්ෂණය විය.	මේ පිළිබඳව ජල සම්බන්ධතාව ලබාගන්නා තැන්පත් මුදල අයකිරීමට හෝ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගනු ලබන බව.	මාර්ග පලුදු කිරීම් කඩිනමින් අලුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය.
(ආ)	සභාවට අයත් ජල බවුසරය හා ගලි බවුසරය කුලියට දීම හා සභාවේ දෛනික ක්‍රියාකාරකම්වල යෙදවීම සම්බන්ධයෙන් ලේඛන පවත්වා ගෙන යාමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී මේවා සම්බන්ධයෙන් විධිමත් ලේඛනවල ලේඛනගත කර ජල බවුසරය හා ගලි බවුසරය කුලියට දීමට පියවර ගනු ලබන බව.	අදාල ක්‍රියාකාරකම් ලේඛනගත කිරීමට හා සභාවේ කාර්යයන් විධිමත් කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	ආයතනවල දැන්වීම් පුවරු සංඛ්‍යාව හා එහි ප්‍රමාණයන් වැනි කාරණා ඇතුළත් ලේඛන නඩත්තු කිරිමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් විධිමත් ලේඛන ස්ථාපිත කර ව්‍යාපාරික ස්ථානවල දැන්වීම් පුවරු පිළිබඳ තොරතුරු ලේඛනගත කරනු ලබන අතර අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගනු ලබන බව.	ලේඛන පවත්වාගෙන යායුතු අතර අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර නිසි අනුමැතින් ලබාගෙන සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගත යුතුය.
(ඇ)	පොදු වෙළඳපොළ කඩකාමර 33ක් සඳහා ඇති කරගත් ගිවිසුම්වල කුලීහිමියන්ගේ කිසිදු අත්සනක් යොදා නොමැති අතර, එම ගිවිසුමේ කොන්දේසිවලට අනුව, කුලීහිමියන් 17 දෙනෙකුගෙන් කිසිදු හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නොතිබූ අතර අයකළ යුතු රු.1,608,000ක හිඟ කුලිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.	ඉදිරි කාලයේදී මේවා සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගනු ලබන බව.	විධිමත් පරිදි ගිවිසුම් අත්සන් කර ගැනීමට හා අයකළ යුතු ආදායම් අයකිරීමට පියවර ගත යුතුය.

(ඉ)	වර්ෂ 08කට අධික කාලයක සිට අක්‍රියව පැවැති බැංකු ජංගම ගිණුම් 03ක ශේෂය රු.925,064ක් ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රවල යෙදවීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	-එම-	අතිරික්ත අරමුදල් නිසි අනුමැතීන් මත ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රවල යෙදවීමට පියවර ගතුයුතුය.
(ඊ)	ජාත්‍යන්තර ස්වෙච්ඡා ආයතනයක් විසින් 2013 වර්ෂයේ සභාවට ලබා දී තිබූ ඩබල් කැබ් රථයේ අයිතිය සභාවට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ද පියවර ගෙන නොතිබුණි.	-එම-	වාහනයේ අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතු අතර නියමිත කාලයට අදාල වාහන ආදායම් බලපත්‍ර ලබාගැනිමටත් පියවර ගතයුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
3.3.1 ඝන අපද්‍රව්‍ය ගාස්තු අයකිරීම්		
සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල කඩවල්, ආපනශාලා, හෝටල් සහ අනෙකුත් ව්‍යාපාරික ස්ථානවලින් අයකරනු ලබන ඝන අපද්‍රව්‍ය ගාස්තු සඳහා විධිමත් ලේඛන පවත්වාගෙන යාමට පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් දූෂණ හා අක්‍රමිකතා සිදුවීමේ අවස්ථා බහුලව පැවැතුණි.	ඉදිරියේදී මේවා සම්බන්ධයෙන් විධිමත් ලේඛන ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව.	ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් රැස්කරන ව්‍යාපාරික ස්ථාන, නිවාස හා අනෙකුත් ඒවා පිළිබඳ විස්තරාත්මක ලේඛන පවත්වා ගාස්තු අයකිරීමට පියවර ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු නිශ්චල හා චංචල දේපළ ස්ථාවර වත්කම් ලේඛනයේ පොදු 22හි ලේඛනගත කර නොතිබුණි.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බව.	සියළුම ස්ථාවර වත්කම් පොදු 22හි පිරිවැය හා ප්‍රත්‍යාගණන වටිනාකම් සහිතව ලේඛනගත කිරීමට පියවර ගතුයුතුය.
(ආ)	2021 හා 2022 වර්ෂ සඳහා ප්‍රාදේශීය සභා කාර්යාලය, මහජන පුස්තකාල හා කියවීම් ශාලා සහ පස් පිරවීමේ පරිශ්‍රයත්, සාතකාගාරය ආදියෙහි සිදු කළ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු නිවැරදි කිරීමට හා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරිමට සභාව විසින්	-එම-	සමීක්ෂණ මණ්ඩලය විසින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

	විගණිත දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		
(ඇ)	2023 වර්ෂයේ රු.14,693,782කට මිලදී ගෙන තිබුණු පොල්තෙල් නිෂ්පාදන ද්‍රව්‍ය, එම නිෂ්පාදන මධ්‍යස්ථානය 2025 අප්‍රේල් 07 දින වන විටත් ස්ථාපිත නොකිරීමෙන් මිලදී ගෙන තිබුණු උපකරණ අනාරක්ෂිත ස්ථානයක ගබඩා කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.	එම පොල්තෙල් නිෂ්පාදන මධ්‍යස්ථානයට මුරකරුවෙකු පත්කර එහි උපකරණ ආරක්ෂා කරනු ලැබේ. අලි වැටවල් ඉදිකිරීමේ මූලික කාර්යයන් මේ වන විට සිදුවෙමින් පවතින බව.	නොපමාව ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ සභා බලප්‍රදේශයේ සර්වෝදය පුරම්හි ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් ප්‍රධාන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානය රු.9,119,642 ක් වැයකර ඉදිකර තිබුණි. එහි සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අලි ආරක්ෂිත වැට නියමිත පරිදි ඉදිකර නොතිබීමෙන් එම ගොඩනැගිල්ලට අලීන්ගෙන් හානි සිදුවූ අවස්ථා පැවැතුණි.	අලි වැට ඉදිකිරීමටත් ඉන් පසුව මෙම ඉඩමේ කාබනික පොහොර සකස්කිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමටත්, හානියට පත්වී ඇති නල අළුත්වැඩියා කිරීමෙන් පසු ඇප මුදල් නිදහස් කිරීමටත් අනුමත කරනු ලබන බව.	අලි වැට නිසි පරිදි ඉදිකිරීමට පියවර ගතයුතුය.

3.6 වාහන උපයෝජනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු වාහන 15ක් සඳහා 2009 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය සඳහා වාහන ආදායම් බලපත්‍ර සහ රක්ෂණ ආවරණය ලබාගෙන නොතිබුණි.	එම වාහන සඳහා රක්ෂණාවරන ලබාගෙන ඇත. ඉදිරියේදී වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගනු ලබන බව.	වර්ෂයට අදාල වාහන ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරනය ලබාගැනීමට කඩිනමින් පියවර ගතයුතුය.

3.7 අත්හැර තිබූ මෙහෙයුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකර අල්හුදා ළමා උද්‍යානය ඉදිකිරිම සඳහා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදාන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.1,997,500කට මිලදී ගෙන තිබුණු ක්‍රීඩා උපකරණ අව්වැසිවලින් ආරක්ෂා කිරිමට සුදුසු ක්‍රියාමාර්ග නොගැනීමෙන් එහි ජීව කාලය අඩුවෙමින් පැවැති අතර ක්‍රීඩා උපකරණ හානි වී අනාරක්ෂිතව පැවැතුණි. එසේම, මෙම ළමා උද්‍යානය	මෙම උද්‍යානය ඉදිකිරීමේ ඇස්තමේන්තු වාර්තාවේ ආරක්ෂිත විධිවිධාන සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් ඇතුළත්ව නොතිබුණි. උද්‍යානයේ ක්‍රීඩා උපකරණ ආරක්ෂා කිරිමට කූඩාරම් හා අනෙකුත් ආරක්ෂිත වැඩපිළිවෙලවල් LDSP වැඩසටහනින් ක්‍රියාත්මක කිරිමට ඉදිරිපත් කළ යෝජනා අනුමත	ළමා උද්‍යානයේ ආරක්ෂාව තහවුරු කර ක්‍රීඩා උපකරණවල පැවැත්ම සම්බන්ධයෙන් ද සැලකිල්ල යොමු කර අරමුණු ඉටුකර ගත යුතුය.

පිහිටි ගංඉවුර කිඹුලන් ගහනව පවතින ස්ථානයක් වන බැවින් ජනතාවට ආරක්ෂිත ස්ථානයක් ලෙස නොපැවැතීමෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.	නොකිරීමෙන් අනාරක්ෂිත බැවින් සවිකළ නොහැකි වී තිබුණි. ඉදිරියේදී සිදුකිරීමට පියවර ගනු ලබන බව.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මගින් ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී මේ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව.	අභ්‍යන්තර විගණනය මගින් සභාවේ මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

4.2 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක රෙගුලාසිවලට අනුකූලව කර්මාන්ත ආයතන 23ක කල් ඉකුත් වූ බලපත්‍ර අළුත් කිරීමට, අවලංගු කිරීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ අත්හිටුවීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, සභාව විසින් භාවිතා කරන ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථාන ඉඩම, ඝාතකාගාරය ආදියට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාරිසරික බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	පාරිසරික බලපත්‍ර ගත යුතු ආයතන පිළිබඳ තොරතුරු රැස්කර ඒවා ලියාපදිංචි කිරීමට පියවර ගනු ලබන බව.	පනතේ ප්‍රකාරව, පාරිසරික බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත ආයතන හඳුනාගෙන ලේඛන යාවත්කාලීන කිරීමට පියවර ගතයුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමටත්, මැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරි අනාගතයේදී සභාවේ ඉලක්කයන් සඳහා දර්ශක ස්ථාපිත කර අයවැයෙන් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛ ප්‍රකාරව ඉලක්ක සපුරා ගත හැකි වන පරිදි දර්ශක ස්ථාපිත කර අයවැයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමට පියවර ගත යුතුය.